**දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය - 2022**
**-----------------------------------------------------------**

දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3027 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකෙන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දක්ෂිණ අධිවේගී මාර්ගයට සම්බන්ධ කිලෝ මීටර් 33ක් වැඩි දියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම තුළින් ජාතික ප්‍රවාහනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,248කට සමාන වූ එජඩො මිලියන 95ක් වන අතර ඉන් රු.මිලියන 9,025කට සමාන එජඩො මිලියන 70ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 3,223කට සමාන එජඩො මිලියන 25ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2014 මැයි 27 දින ආරම්භ කරන ලද අතර, 2018 දෙසැම්බර් 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය කටයුතු *අවසන් කරන* දිනය 2022 දෙසැම්බර් 31 *දක්වා* දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

2022 දෙසැම්බර් 31 දිනට දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදි. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා

බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී..

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩු | මුදල<br>රු. මිලියන | කළමනාකරණයේ<br>ප්‍රතිචාර | විගණකගේ<br>නිර්දේශය |
|---|---|---|---|
| ඉඩම් හිමියන්ට රු.මිලියන 1019 ක ව්‍යවස්ථාපිත වන්දි ගෙවීම ප්‍රමාද කිරීම නිසා 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 314 ක පොලිය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | 314 | ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි (රු. බිලියන 1.2) සහ ගෙවිය යුතු පොලී (බිලියන 0.5) සම්පූර්ණ කරන ලද වවුචර් ප්‍රමාණය 2022 සැප්තැම්බර් මස අවසන් වන විට මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අංශය වෙත භාර දී වගකීමක් ලෙස RDA මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |

**2.2 නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචා | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.3.1 වගන්තිය සහ 2012 අගෝස්තු 07 දිනැති අංක 2/2002 දරන මුදල් චක්‍රලේඛය. | SRCP/CP - 5 පැකේජයේ ඉංජිනේරු ඇස්තමේන්තුවේ BOQ අයිතම සහ අතුරු ගෙවීම් සහතික අංක 21 යටතේ ඇති අයිතම සංසන්දනය කිරීමේදී කොන්ත්‍රාත් පැකේජ වල ඉන්ජිනේරු ඇස්තමේන්තු නිවැරදිව සකස් කර නොතිබීම හේතුවෙන් රු.මිලියන 324.94 ක් වටිනා වැඩ අයිතම 32 ක් සම්පූර්ණයෙන් ඉටුකර නොතිබුණු අතර රු. මිලියන 825.22 වටිනාකමින් යුත් වැඩ අයිතම 26 ක් අර්ධ වශයෙන් ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය. | මුල් වැඩ විෂය පථය සඳහා සකස් කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ අයිතම සම්පූර්ණයෙන් ඉටුකල නොහැක. | ඉංජිනේරු ඇස්තමේන්තුව නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 වගන්තිය. | ඊට අමතරව රු.මිලියන 643.65 ක් වටිනා වැඩ අයිතම 43 ක් අනුමත BOQ ප්‍රමාණයේ සීමාවන් ඉක්මවා තිබුණු අතර මෙහිදී ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අත්පොතේ පරිපූරක 14 අනුව සකස් කර නොතිබුණු බව නිරීක්ෂණය විය | මුල් කොන්ත්‍රාත්තුව සංශෝධනය කළ යුතු අතර, MPC හි අනුමැතිය ඇතිව, සහ ADB එකඟතාවයෙන් කොන්ත්‍රාත් මුදල සංශෝධනය කරන ලදී | BOQ නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | අත්කරගත් කාර්යසාධනය | | |
| | | ප්‍රතිශතය | ප්‍රතිශතය | | |
| කොන්ත්‍රාත් පැකේජය- ( | මාර්ග ඉදි කිරීම් | 100 | 86 | ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ සත්‍ය ප්‍රගතිය අපේක්ෂිත ප්‍රගතියට වඩා අඩුවෙන් පැවතුණි. | COVID-19 වසංගතය, ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය, ආර්ථික අර්බුදය සහ විෂය පථය වෙනස් වීම. |

| | |
|---|---|
| **කළමනාකරණයේ ප්‍රතිචාරය** | ප්‍රධාන වශයෙන් කොවිඩ් 19 වසංගතයද, ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රමාදය, ආර්ථික අර්බුදය හා විෂය පථය වෙනස් වීම් කොන්ත්‍රාත් පැකේජ 05හි භෞතික ප්‍රගතිය ප්‍රමාද වීමට හේතු විය. |
| **විගණකගේ නිර්දේශය** | වැඩ සැලැස්මට අනුව මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති මෙහෙයුම් ප්‍රගතිය සහ ප්‍රතිඵල මැනීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක ස්ථාපිත කර නොතිබුණි. එබැවින්, ව්‍යාපෘතියෙන් මහජනතාවට ලැබෙන ප්‍රතිලාභ මට්ටම විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. | ව්‍යාපෘතියේ මෙහෙයුම් ප්‍රගතිය, එනම් නිමකර ඇති ඇති කි.මී. ගනණ, පාලම්/බෝක්කු ගනණ ,රැඳවුම් බිත්තියේ දිග, නිමකර ඇති මංතීරු කි.මී. ගනණ ආදී ප්‍රතිඵල මුල් විෂය පථයට අදාළව මනිනු ලැබේ. | "SMART" KPI ස්ථාපිත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ සංශෝධිත විෂය පථයට අනුව කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කයේ ජාතික මාර්ග 06 ක කිලෝමීටර් 45.77 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පැකේජ 05 ක් යටතේ මාර්ග ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. කොන්ත්‍රාත් පැකේජ-3 නියමිත දිනට අවසන් කර තිබුණද, කොන්ත්‍රාත් පැකේජ (CP) 1, 2 සහ 4 හි ඉදිකිරීම් කටයුතු පිළිවෙලින් දින 248, දින 534 සහ දින 689ක ප්‍රමාදයකින් අවසන් කර තිබුණි. CP-1 සිට CP-4 දක්වා ප්‍රගතිය සියයට සියයක් සම්පූර්ණ කර ඇති බව සඳහන් කර තිබුණද, ඉදිකිරීම්වල විෂය පථයේ පසුව සිදු වූ වෙනස් කිරීම් නිසා CP-2, CP-3 සහ CP-4 හි ඉතිරි වැඩ CP-5 පැකේජයට එක් කරන ලදී. කොන්ත්‍රාත් පැකේජ - 5 හි පුනරුත්ථාපන කටයුතු 2020 පෙබරවාරි 29 දින ආරම්භවී 2021 නොවැම්බර් 30 දින නිම කිරීමට නියමිතව තිබූ නමුත් 2022 දෙසැම්බර් 31 වන විටත් වාර්තා වී ඇත්තේ සියයට 86ක භෞතික ප්‍රගතියක් පමණි. ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු සඳහා වැයවන මුදල රු. මිලියන 2,536ක් වන බවට ඇස්තමේන්තු කර ඇති අතර එය ඉදිරියේදී රජයට වැය බරක් වනු ඇත. ඊට අමතරව පැකේජ-5 හි ඉතිරි කටයුතු ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන මගින් (I-රෝඩ් ව්‍යාපෘතිය ) සිදු කිරීමට සැලසුම් කර තිබුණු නමුත් ඉතිරි කටයුතු සඳහා මේ දක්වා කිසිදු ගිවිසුමක් නොතිබුණි. | B-084 මාර්ගයේ 23+400 සිට 28+ 180 දක්වා මාර්ග කොටසේ මතුපිට සහ ඉතිරි ඉදිකිරීම් කටයුතු සහ CP-2 යටතේ A-004 මාර්ගයේ 15+ 360 සිට 16+280 දක්වා මාර්ග කොටසේ සියලුම වැඩ පමණක් CP-5 ට එකතු කරන ලදී. කෙසේ වෙතත්, CP-3 සහ CP- 4 හි ඉතිරි කාර්යයන් CP-5 වෙත එකතු කර නොමැත. CP-5 පැකේජය 2020 පෙබරවාරි 29 වන දින ආරම්භ කර 2022 නොවැම්බර් 15 දින අවසන් කරන ලදී. 2022 අගෝස්තු මාසයෙන් පසු රට සාමාන්‍ය තත්වයට පත් වූ විට CP-5 ව්‍යාපෘතිය ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීම සඳහා නැවත වැඩ ආරම්භ කරන ලදී. | ව්‍යාපෘතියේ විෂය පථය අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කිරුළපන සිට ගොඩගම සහ පාමංකඩ සිට පොකුණුවිට මාර්ගයේ කිලෝමීටර් 12.45 ක SRCP/CP 5 ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු 2020 පෙබරවාරි 29 වන දින රු.මිලියන 4,215 ක වටිනාකමකට ආරම්භ කර 2021 අගෝස්තු 21 දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් කොන්දේසි වලට අනුව දින 853 ක කාලය දීර්ඝ කිරීමක් කොන්ත්‍රාත්කරුට ලබාදෙමින් ව්‍යාපෘතිය 2022 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් දින 177ක කාලය දීර්ඝ කිරීමේ පිරිවැයට අදාළව රු.මිලියන 160ක් ඉල්ලා ඇති බවත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය සැලකිල්ලට නොගෙන ව්‍යාපෘතිය විසින් එම හිමිකම් පෑම අනුමත කර ඇති බවත් නිරීක්ෂණය විය. | CP-5 පැකේජයේ ආරම්භය 2020 පෙබරවාරි 29 දින වන අතර 2020 මාර්තු සිට 2021 සැප්තැම්බර් දක්වා COVID-19 වසංගතය ශ්‍රී ලංකාව තුළ පැතිරෙමින් තිබුණි. එබැවින්, කොන්ත්‍රාත් කාලය තුළ පැවතුණු තත්ත්වය සේවායෝජකයාට සහ කොන්ත්‍රාත්කරුට පාලනය කළ නොහැකි බැවින් ව්‍යාපෘතියට කොන්ත්‍රාත්කරු සඳහා EOT ප්‍රදානය කිරීමට සිදු විය. | අතිරේක පිරිවැය අවම කිරීම සඳහා නිවැරදි පියවර ගත යුතුය |
| (ඇ) | 2022 මැයි 17 දිනැති විචලතා අනුමත කිරීමේ ලිපියට අනුව, විචලතා සීමාවේ මුළු එකතුව රු.මිලියන 519ක් ලෙස අනුමත කර තිබුණු නමුත් අතුරු ගෙවීම් සහතික අංක 21 (CP-5) අනුව ව්‍යාපෘතියේ සත්‍ය විචලතා වල වටිනාකම රු.මිලියන 525 කි. කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා හේතුවෙන් සත්‍ය විචලතා ප්‍රමාණය අනුමත විචලතා සීමාව රු.මිලියන 5.57කින් ඉක්මවා ගොස් තිබුණි. | එකඟ වේ. විචලතා නියෝගවල කටයුතු සිදු කරන විට, සමහර අවස්ථාවන්වලදී ඇස්තමේන්තුගත ප්‍රමාණයන් ඉක්මවා යනු ඇත. | අනුමත විචලතා සීමාවන්ට අනුකූල වීමට ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | කොන්ත්‍රාත්කරු විසින් නිකුත් කරන ලද අංක 29 දරන SRCP/CP-3 අන්තර්කාලීන ගෙවීම් සහතිකය රු. මිලියන 248.6ක් ගෙවීම සඳහා 2019 ජුනි 24 දින ඉදිරිපත් කළද, ව්‍යාපෘතිය වසර 3ක ප්‍රමාදයකින් යුතුව 2022 ජූලි 05 දින එම මුදල පියවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාද වූ කාලය සඳහා කොන්ත්‍රාත්කරු රු.මිලියන 46.9 ක පොලියක් ඉල්ලා තිබුණු අතර, ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් පියවීමේ ප්‍රමාදය බලපා ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ. ඉදිකිරීම් සිදුවෙමින් පවතින විට, සමහර ප්‍රායෝගික අවශ්‍යතා හඳුනාගෙන විෂය පථය වෙනස් කිරීමට සිදු වේ. එබැවින් මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත් මුදල සංශෝධනය කිරීමට සිදු වේ. | ප්‍රමාද ගාස්තු නොගෙවා නියමිත වේලාවට ගෙවීම් පියවීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටලු

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ලැබී ඇති තොරතුරු අනුව, රජයට අයත් ඉඩම් කැබලි 1,562ක් ඇතුලුව ඉඩම් කැබලි 8,499ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණු අතර ඉන් ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 17 වගන්තිය යටතේ රු. මිලියන 8,249ක වන්දි මුදලක් ගෙවා තිබුණි. තවද ඉඩම් අත්පත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුවේ තීරණය යටතේ රු. මිලියන | කෙසේ වෙතත්, වන්දි ගෙවීමේ ප්‍රමාදයන් සඳහා පොලිය සඳහා ගෙවා ඇති මුදල රු.මිලියන 403.09 කි. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ඉඩම් කැබලි ලියාපදිංචි කිරීම ඉඩම් අමාත්‍යාංශය සමඟ | අතිරේක පිරිවැය අවම කිරීම සඳහා වන්දි ගෙවීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 3,223ක අමතර ගෙවීමක් සිදුකර තිබුණි. ඊට අමතරව 2022 දෙසැම්බර් 31 දින දක්වා වන්දි ගෙවීම ප්‍රමාද වීම මත පොළී වශයෙන් එකතුව රු. මිලියන 899ක් ගෙවා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. මිලියන 1,714 ක් වූ හිඟ වවුචර්වල වටිනාකම RDA වෙත භාර දී තිබුණි. කෙසේ වෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ දුර්වල අධීක්‍ෂණය හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ කිසිදු ඉඩමක් 2022 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි කර නොතිබුණි. | එක්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදු කරමින් පවතී. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට රාජ්‍ය ආයතන කිහිපයක් සම්බන්ධ වන අතර ඒවා ව්‍යාපෘතිය මගින් මෙහෙයවිය නොහැක. | |
| (ආ) | ව්‍යාපෘතිය මගින් ඉඩම් කැබලි 8,503ක් අත්පත් කරගෙන තිබුණද, සමහර ඉඩම් කැබලි (කිරුළපන සිට හෝමාගම දක්වා) ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණි. | එකඟ වේ.<br>ඉඩම් අත්පත් කර ගැනීම ආරම්භ කළ පසු මුල් අයිතිකරුවන්ගේ කැමැත්ත ඇතිව අත්පත් කර ගැනීම් කටයුතු සිදුකල යුතුය. | භාවිතයට නොගත් ඉඩම් කැබලි ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුයි. |

### 3.4 වාරක පරීක්ෂණ නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| SRCP/ CP-5 පැකේජය යටතේ විදුලි රැහැන් සහ දුරකථන මාර්ග නැවත ස්ථානගත කිරීම සඳහා ව්‍යාපෘතිය මගින් ලංකා විදුලිබල මණ්ඩලයට සහ ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත පිළිවෙලින් රු. මිලියන 93.95 ක් සහ රු. මිලියන 43.24 ක් ගෙවා තිබුණද, විදුලි කණුවලින් සියයට 65 ක් සහ ලංවිම ට්‍රාන්ස්ෆෝමර්වල වැඩ සියයට 26 ක් අවසන් කර තිබූ අතර ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ දුරකථන කණුවලින් සියයට 74ක් 2022 දෙසැම්බර් 31 වන විට නිම කර තිබුණි. තවද ව්‍යාපෘතිය විසින් BOQ මුදල වන රු.මිලියන 36.8 කට වඩා රු.මිලියන 100 ක් නිසි අනුමැතියකින් තොරව ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>ලංවිම සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන දෙඅංශයේම ඇස්තමේන්තුගත මුළු ගෙවීම සිදු කරන තුරු ඔවුන් ලබා දී ඇති වැඩ විෂය සඳහා කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ නොකරනු ඇත. | කාල රාමුව තුළ වැඩ අවසන් කර කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව අධීක්ෂණය කිරීමට උපදෙස් ලබා දිය යුතුය. |

### 3.5 නිෂ්ක්‍රීය/ අක්‍රීය/ ඌන උපයෝජිත සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ ණය ගිවිසුම 2014 මැයි 27 වැනි දින ඇමෙරිකානු ඩොලර් මිලියන 70කට අත්සන් කර 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් අරමුදල් සපයන ආයතනය විසින් ණය අවසන් දිනය 2022 දෙසැම්බර් 31 දක්වා කිහිප වතාවක් දීර්ඝ කර තිබුණි. අරමුදල් නියෝජිතායතනය විසින් ණය අවසන් දිනය දීර්ඝ කර තිබුණද කළමනාකාරීත්වයේ අකාර්යක්ෂමතාව හේතුවෙන් ණය කල් ඉකුත්වීමට පෙර සම්පූර්ණ ණය පහසුකම ප්‍රයෝජනයට ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණු අතර රු.මිලියන 478 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 1.32 ක මුදලක් ව්‍යාපෘතිය මගින් ප්‍රයෝජනයට ගැනීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. | ADB විසින් ණය ශේෂය භාවිතා කිරීමට අනුමත කර ඇතත්, ණය ලබා දීමේ කාලය 2022-12-31 දක්වා දීර්ඝ කලද, ණය මුදල් භාවිතා කිරීම 2022-06-30 දක්වා සීමා කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඩොලර් මිලියන 1.32 ක මුදල ප්‍රයෝජනයට නොගෙන ණය මුදල අවසන් කිරීමට සිදුවිණි. | ණය පහසුකම ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුව තිබුණි. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 316.13 ක් ගෙවීමට තිබියදී, ඉතිරිව ඇති අග්‍රිම ශේෂයෙන් එම මුදල පියවීමට ව්‍යාපෘතිය අපොහොසත් වී ඇති අතර ඉතිරි රු. මිලියන 154.76 ක ඉතිරි අග්‍රිම ශේෂය ණය දෙන ආයතනය වෙත ආපසු යවා තිබුණු බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>ADB විසින් ණය කාලය දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව, උපයෝජනය නොකල ණය ශේෂය ආපසු ADB වෙත ලබා දිය යුතුය. | ණය පහසුකම ඵලදායී ලෙස උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියේ ප්‍රාග්ධන වැය විෂය අංක 117-2-4-43-2105-17 යටතේ ශ්‍රී ලංකා රජය වෙන් කළ රු.මිලියන 727 න් ව්‍යාපෘතිය රු.මිලියන 126 ක් පමණක් භාවිතා කර තිබූ අතර සියයට 83 ක් නියෝජනය කරමින් රු. මිලියන 601 ක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. ප්‍රතිපූරණය කළ හැකි විදේශ ආධාර සඳහා වෙන් කළ රු.මිලියන 30 න් ව්‍යාපෘතිය රු.මිලියන 23 ක් පමණක් භාවිතා කර තිබූ අතර සියයට 20 ක් නියෝජනය කරමින් රු. මිලියන 6 ක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර ගෙන නොතිබූ බව ද නිරීක්ෂණය විය. එබැවින් ව්‍යාපෘතියේ නිම නොකළ වැඩවල පිරිවැය ඉදිරියේදී රජයට දැරීමට සිදුවිය හැකිව තිබුණි. | 2022 සඳහා රු.මිලියන 727 ක ප්‍රතිපාදන ලබා දී ඇතත්, ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ ගෙවීම් සඳහා ප්‍රතිපාදන පියවීමට ලැබී ඇත්තේ රු.මිලියන 120 ක් පමණ ක් සහ ප්‍රතිපූරණය කළ හැකි විදේශ ආධාර වැය විෂය අංක (117-2-4-43-2506-14) සඳහා රු.මිලියන 30 ක් සහ රු.මිලියන 23.7 ක් භාවිතා කරන ලදී. තවද 2022 ජූනි මාසයේ ණය උපයෝජනය අවසන් කිරීමට සිදුවීම නිසා මෙමෙ වැය විෂය භාවිතා කළ හැකිව තිබුනේ මාස හයක් පමණි. | සම්පූර්ණ ප්‍රතිපාදන ඵලදායී ලෙස භාවිතා කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සම්පූර්ණ ණය මුදල සඳහා පොලී සහ බැඳීම් ගාස්තු වශයෙන් රු.මිලියන 311ක් ගෙවා ඇති බව නිරීක්ෂණය වූ අතර ඩොලර් මිලියන 70 ක් වූ මුළු ණය මුදලින් ඩොලර් මිලියන 1.32 ක මුදලක් ව්‍යාපෘතිය විසින් භාවිතා කර නොතිබූ අතර ණය දෙන ආයතනයට ආපසු ගෙවා තිබුණි. මෙහිදී රු.මිලියන 5.8ක් වටිනාකම වූ පොලී සහ බැඳීම් ගාස්තු උපයෝජනය නොකළ ණය මුදල් සඳහා ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | ADB විසින් පොලී සහ බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 311ක් අය කර අයකරගෙන තිබුණු අතර එය ණය මුදල ලබා දෙන අවස්ථා වේ ඇති කරගත් කොන්දේසි වලට අනුව ණය උපයෝජනය පිළිබඳ නොසල කා 2019 වර්ෂය අවසානයේ සම්පූර්ණ මුදලම අයකරගෙන තිබුණි. | ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**3.6** මතභේදාත්මක ගනුදෙනු

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පැකේජය 5 ට අදාළ රු.මිලියන 210 ක රඳවා ගැනීමේ මුදල් දැනටමත් කොන්ත්‍රාත්කරු වෙත මුදා හැර තිබුණි. කෙසේ වෙතත් මෙම පැකේජයේ අවසන් නොකළ කාර්යයන් ඒකාබද්ධ මාර්ග ආයෝජන ව්‍යාපෘතියට පැවරීමට තීරණය කර තිබුණි. | SRCP ණය අවසන් කිරීමට සමාන්තරව CP-5 පැකේජය සම්පූර්ණ කිරීම කොන්ත්‍රාත්කරුගේ තීරණයක් නොවන නමුත් එය සේවායෝජකයාගේ තීරණයකි. රඳවා ගැනීමේ මුදල් රඳවා ගැනීමට ගිවිසුම්ගත බැඳීමක් නොමැත. | සම්පූර්ණ කිරීමේ වාර්තාව නිකුත් කිරීමෙන් පසු රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමට උපදෙස් දිය යුතුය. |
| (ආ) | 2017 ජුනි 19 වන දින ඉදිරිපත් කරන ලද IPC 15 යටතේ කොන්ත්‍රාත් පැකේජය-1 වෙතින් අයකර ගන්නා ලද රු.මිලියන 31.95 ක ප්‍රමාද හානි 2019 ඔක්තෝබර් 10 වන දින කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර ඇත. තවද, රු.මිලියන 14.14 ක ප්‍රමාද හානි කොන්ත්‍රාත් පැකේජ 4 න් අඩු කර 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වගකීම් ලෙස සටහන් කර ඇත ඇති බව නිරීක්ෂණය විය . මෙලෙස ප්‍රමාද හානි මුදාහැරීම විගණනයේ දී ගැටලුකාරී විය. | අදාළ අධිකාරියේ EOT සඳහා නිසි අනුමැතිය සහිතව, CP-1 පැකේජයේ අයකරගත් ප්‍රමාද ගාස්තු පසුව නිකුත් කර ඇත. CP-4 පැකේජයේ කොන්ත්‍රාත්කරු EOT සඳහා තවමත් අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අතර එම නිසා ඉංජිනේරුවරයා විසින් අඩු කරන ලද ප්‍රමාද හානි වගකීමක් ලෙස සටහන් කර ඇත. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව ප්‍රමාද හානි ඉල්ලා සිටීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |